**ශීර්ෂය 215 - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බැවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**-----------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කල නොහැකි විය.

(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුලදී සිදු කරන ලද නියැදි පරීක්ෂාවේ දී වැය විෂයයන් 16 කට අදාලව අනුමත ප්‍රතිපාදන සීමාව ඉක්මවා එකතුව රු.මිලියන 14.46 ක බැරකම්වලට බැඳී තිබුණි. | විධිවිධාන ප්‍රකාරව අනුමත ප්‍රතිපාදන සීමාව තුළ කටයුතු කල යුතු වීම. | අත්‍යවශ්‍යය වියදම් කලයුතු බැවින් බැරකම්වලට යොමුව ඇත. |
| (ආ) 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 වගන්තිය ප්‍රකාරව වාර්තා නොකල බැරකමක් පෙර වර්ෂයේ වියදම් ලෙස 2019 වර්ෂයේ නිරවුල් නොකල යුතු වුවත් 2018 වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස දක්වා නොමැති රු.634,039 ක වටිනාකමක් 2019 වර්ෂයේ නිරවුල් කර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවීම. | 2018 වර්ෂයට අදාලව 2019 වර්ෂයේ සිදු කල සෑම ගෙවීමක්ම සටහන් කර ඇත. |
| (ඇ) 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති බැඳීම් හා බැරකම් ප්‍රකාශනය හා භාණ්ඩාගාර බැඳීම් හා බැරකම් ප්‍රකාශය අතර රු.මිලියන 16.75 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දි භාණ්ඩාගාර බැඳීම් හා බැරකම් සමඟ එකඟ කිරිමට කටයුතු කල යුතු විම. | නොලැබීඇති බිල්පත්වල සත්‍ය වටිනාකම උපකල්පනය කල නොහැකි නිසා එම වටිනාකම ඇතුලත් කර නොමැත. |

**2.2 තැන්පත් ශේෂයන්**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 03 ක 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 63.14 ක් වූ අතර ඒ තුල වසර 02 ක ඉක්ම වූ තැන්පතු වටිනාකම රු.මිලියන 10.92 ක් විය. | මුදල් රෙගුලාසි 571 විධිවිධාන ප්‍රකාරව වසර 02 ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කල යුතුවීම. | ඇප රැඳවුම් කාලය අවසාන වී ඇති තැන්පතු හා අනෙකුත් තැන්පතු නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**2.3 බැංකු ගිණුම් මෙහෙයවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ බැංකු සැසඳුමෙහි ඇතුලත් රු.601,635 ක් වූ හඳුනා නොගත් ලැබීම් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | හඳුනානොගත් ලැබීම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුවීම. | හඳුනානොගත් ලැබීම් හඳුනාගෙන ඉවත් කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති සඳහා පවත්වා ගෙන යනු ලැබූ ජංගම ගිණුම් 02 ක් 2015 වර්ෂයට පෙර සිට අක්‍රීයව පැවතුණු අතර, 2018 දෙසැම්බර් 31 දිනට එම ගිණුම්වල ශේෂය රු.63,150 ක් විය. | අක්‍රීය බැංකු ගිණුම් වසා දැමීම හෝ වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගත යුතු වීම. | මෙම ගිණුම් නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියට හා JICA නමින් ආරම්භ කර ඇත. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 (අ) ඡේදය ප්‍රකාරව අදාල වර්ෂයට යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර , වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදී විස්තර සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව පිළියෙල කල යුතු වීම. | 2019 වර්ෂයේදී මෙම කරුණු ඇතුලත් කරන බව. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ක්‍රියාකාරී සැලැස්ම අනුව තාක්ෂණ/ කාර්මික විද්‍යාල 39 ක පාඨමාලා 106 ක් සඳහා සිසුන් 37,685 ක් බඳවා ගැනිමට සැලසුම් කර තිබුණි. එහෙත් විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ පාඨමාලා 113 ක් සඳහා බඳවා ගත් සිසුන් සංඛ්‍යාව 32,151 ක් පමණක් විය. එයින් ද සිසුන් 7,579 ක් හෙවත් සියයට 24 ක් පාඨමාලා හැරගොස් තිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම අනුව අපේක්ෂිත අරමුණට කරා ලඟා වීමට කටයුතු කල යුතුවීම. | මෙම තත්ත්වය 2020 වර්ෂයේ දී අවම කිරීමට කටයුතු කරනු ඇත. |
| (ආ) 2013 පෙබරවාරි 26 දිනැති අංක 01/2013 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛය අනුව සියළුම වෘත්තීය පාඨමාලා ප්‍රතීතනය කළ යුතු වුවද, 2018 දෙසැම්බර් 31 දිනට තාක්ෂණ/කාර්මික විද්‍යාල 39 හි පවත්වාගෙන යනු ලබන පාඨමාලා 839 කින් තාක්ෂණ/කාර්මික විද්‍යාල 29 ක පාඨමාලා 73 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ප්‍රතීතනය කර | චක්‍රලේඛ විධිවිධාන අනුව සියලුම පාඨමාලාවන් ප්‍රතීතනය කල යුතුවීම. | මින් පාඨමාලා 61 ක් 2019 මැයි වන විට ප්‍රතීතනය වී ඇත. |

නොතිබුණි.

**3.3 විදේශ ආධාර ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ 2016 අගෝස්තු 16 දිනැති අංක EST / 7 / ALLOW / 05 / 0110 දරණ නිපුණතා සංවර්ධන හා වෘත්තිය පුහුණු අමාත්‍යාංශයේ ලේකම් ඇමතු ලිපිය අනුව බාහිර සම්පත් දායකයින් ලෙස රාජ්‍ය අංශයේ නොවන නිලධාරින්ට දිනකට පැය 06 ක් හා රාජ්‍ය අංශයේ නිලධාරින්ට දිනකට පැය 03 ක් සඳහා පමණක් දීමනා ගෙවීමට අනුමැතිය ලබා දී තිබුණි. එහෙත් ආංශික නිපුණතා සංවර්ධන හා වෘත්තිය පුහුණු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කල පුහුණු වැඩසටහන් සඳහා චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව එක් සම්පත් දායකයෙක් සඳහා පැය 08 ක් ආවරණය වන පරිදි සැලසුම් කර තිබුණි. එහෙත් සම්පත් දායක දීමනා සඳහා ගෙවීම් කිරීමේදී දිනකට පැය 06 ක් හා පැය 02 ක් ආවරණය වන පරිදි සම්පත් දායකයන් දෙදෙනෙකුගේ නම් ඇතුලත් කර සම්පත් දායක දීමනා ගණනය කර තිබුණි. | බාහිර සම්පත්දායකයින් සඳහා දිනකට ගෙවන පැය 06 වෙනුවෙන් වැඩසටහන් සකස් කල යුතු අතර එක් එක් බාහිර දේශකයාට වැඩසටහන් යොමු කිරිමට අදාල ලියවිලිවල පිටපත් ගොනු කර තබා ගත යුතුවේ. එසේම ගෙවීම් කිරිමේ දී නිවැරදිතාවය පිළිබඳ අවධානය යොමු කිරීමත් කල යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනේ ප්‍රතිපාදන මත රු.මිලියන 22.88 ක් වැය කර 2017 වර්ෂයේ පෙබරවාරි මාසයේ දී යාන්ත්‍රික ශිල්පි පාඨමාලාව සඳහා මිළදි ගත් CNC Milling යන්ත්‍රය 2017 ඔක්තෝම්බර් මාසයේදී නුවරඑළිය කාර්මික විද්‍යාලයට ලබාදී තිබුණි. එහෙත් එම යන්ත්‍රය භාවිතා කර සිදු කරන පාඨමාලාවන් කාර්මික විද්‍යාලය තුල නොපවත්වන බැවින් අදාල යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අක්‍රීයව පැවතුණි. එමෙන්ම මෙම යන්ත්‍රය ක්‍රියාවිරහිතව තැබීම නිසා අක්‍රීය විය හැකි බැවින් අවම වශයෙන් දිනකට පැය 3ත් 4ත් අතර කාලයක් 27 KVA ක | අවශ්‍යතාවය හඳුනා ගෙන වත්කම් මිළදී ගත යුතු අතර මිළදී ගත් වත්කම් උපරිම ධාරිතාවයකින් යුතුව භාවිතා කල යුතු වේ. | 2018 වර්ෂයේ පාඨමාලා කිහිපයක ප්‍රායෝගික කටයුතු වෙනුවෙන් හා 2019 වර්ෂයේ පැය 300 ක පාඨමාලාවක් ආරම්භ කොට ඇත. |

විදුලි පරිභෝජනයක් යටතේ ක්‍රියා කරවීමට සිදුවී තිබුණි.

**3.4 කළමනාකරණ දුර්වලතා**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතු අක්කර 13 ක ඉඩම් කැබලි 06 ක් බාහිර පාර්ශවයන් වෙත අවිධිමත් ලෙස මුදා හැර තිබුණු අතර එම වත්කම් නිත්‍යානුකූලව පවරා දීම හෝ ආපසු ලබා ගැනීම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදු කර නොතිබුණි. | වත්කම් නිත්‍යානුකූලව පවරා දීමට හෝ ආපසු ලබා ගැනීමට කටයුතු කල යුතුවීම. | ඉදිරියේදී වත්කම් පවරා දීමට හෝ පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | වසර එකේ සිට වසර 14 ක් දක්වා වූ කාලපරිච්ඡේදයකට අදාලව ස්ථාන මාරු වීම්, විශ්‍රාම යෑම හා මිය යෑම හේතුවෙන් නිලධාරීන් 59 දෙනෙකුගෙන් අයවිය යුතු රු.මිලියන 1.77 ක ණය ශේෂයන් විගණිත දිනය වූ 2019 අප්‍රේල් 30 දක්වාම නිරවුල් වී නොතිබුණි. | හිඟ ණය ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 485 (4) හා ආයතන සංග්‍රහයේ **xxiv** පරිච්ඡේදයේ 4 ඡේදය ප්‍රකාරව කටයුතු සිදු කල යුතුවීම. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට වැඩ අවසාන කර නොතිබුණු ගොඩනැගිලි 03 කට අදාලව රු.මිලියන 221.42 ක් වූ කෙරීගෙන යන වැඩ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ යටතේ නොදක්වා දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | කෙරී ගෙන යන වැඩ වටිනාකම යටතේ ගිණුම්ගත කල යුතුවීම. | ඉදිරි ගිණුම්වල නිවැරදි කරනු ලැබේ. |
| (ඈ) | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුවීම. | ඉදිරියේදි ඇප ලේඛන සකස් කිරිමට කටයුතු කරනු ලැබේ. |

## 3.5 විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා නොදීම

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් විගණන විමසුම් සඳහා 2019 ජූනි 30 දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.

| විගණන විමසුම පිළිබඳ විස්තරය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වාරක පරීක්ෂණය - හෝමාගම කාර්මික විද්‍යාලය 2018<br><br>(ආ) දුෂ්කර පාසල් සඳහා ඩෙස් පුටු ලබා දීමේ සමාජ සත්කාර වැඩසටහන පිළිබඳ පරීක්ෂාව - හෝමාගම කාර්මික විද්‍යාලය<br><br>(ඇ) යන්ත්‍රෝපකරන මිළදී ගැනීම් පිළිබඳ පරීක්ෂාව - මරදාන තාක්ෂණ විද්‍යාලය<br><br>(ඈ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් බී ගිණුම පරීක්ෂාව 2018 වර්ෂය | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරි විසින් මුදල් රෙගුලාසි 452(1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය නියමිත කාලයකට පසුව පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතු අතර, එම විමසුම්වලට වහාම පිළිතුරු ලබා දිය යුතුය. එසේ පිළිතුරු ලබාදී ම ප්‍රමාද විය හැකි විමසුම් වේනම් ඒ සඳහා අතුරු වාර්තාවක් යැවීමට කටයුතු කළ යුතුවීම. | නොපමාව පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

\\\\

## 3.6 විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හෝමාගම කාර්මික විද්‍යාලයේ වායු හා වාප පැස්සුම් කර්මාන්ත ශාලාව යොදා ගනිමින් සිදු කර තිබූ දුෂ්කර පාසල් සඳහා ඩෙස්පුටු ලබාදීමේ සමාජ සත්කාර ව්‍යාපෘතියට අදාලව ලියවිලි හා ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවුණි. | විගණන පරීක්ෂණ කටයුතු සඳහා අදාල සියලුම ලිපිලේඛන හා ලිපිගොනු ඉදිරිපත් කල යුතුවීම. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.7 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | අදාල විධිවිධාන පරිදි ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දි නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | නොපමාව පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනිම පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනිමට කටයුතු කර නොතිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 2/2017 හි සඳහන් අරමුණු කෙරෙහි අවධානය යොමු කර 2030 වසර වන විට තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනිම සඳහා එම ඉලක්ක මත ක්‍රියාත්මක විය යුතුවීම. | ඉදිරියේදී ක්‍රමවේද සකස් කරනු ලැබේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (කාර්මික අධ්‍යාපන) තනතුර ද, සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරු 02 ක්ද, සහකාර අධ්‍යක්ෂ (ICT) තනතුරු වෘත්තිය උපදේශක නිලධාරී තනතුරු 22 ක්ද, ඇගයීම් නිලධාරි (Evaluation Office) තනතුරු 21 ක් ද, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 698 ක් ද පුරප්පාඩුවී පැවතුණි. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනිම සහ අතිරිත්ත තනතුරු වේ නම් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර සුදුසු පියවර ගැනිම. | ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |